# විදුලි උපකරණයන්හි බලශක්ති කාර්යක්ෂමතාව ලේබල් කිරීමේ ව්‍යාපෘතිය

ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රමිති සැකසුම් මධ්‍යස්ථානය වන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය, විදුලි උපකරණවල බලශක්ති කාර්යක්ෂමතාවය ලේබල් කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර ඇත. ස්වයං පදනම මත මේ සඳහා එක්වන ලෙස විදුලි උපකරණ නිෂ්පාදකයන්ට සහ ආනයන කරුවන්ට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය ආරාධනා කරයි.

## බලශක්ති කාර්යක්ෂමතාවය නිර්ණය කිරීම සඳහා ප්‍රමිතීන්

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඒ සඳහා අවශ්‍ය ප්‍රමිතීන් පිළියෙල කිරීම මූලික අවශ්‍යතාවයකි. එම ප්‍රමිතීන්හි ශක්ති කාර්යක්ෂමතා ලේබලය හා එහි විස්තරාත්මක කරුණු සහ අදාල විදුලි උපකරණවල කාර්යක්ෂමතාවය නිර්ණය කිරීමේ ක්‍රම වේදයන් ආදිය අඩංගුය. **SLS 1200:2001** විද්‍යුත් ලයිට් බැලස්ට් (චෝක්) සඳහා ද **SLS 1225:2002** සංයුක්ත ප්‍රතිදීප්ත පහන් **(CFL)** සඳහාද **SLS 1230:2003** ශීතකරණ, අධිශීතකරණ සඳහා ද දැනට පිළියෙල කර ඇති ප්‍රමිතීන් වේ. ශීතකරණ,/ අධිශීතකරණ සඳහා ලේබල් කිරීම කෙටි කලකින් ආරම්භ කිරීමට නියමිතය.

## ශක්ති කාර්යක්ෂමතා ලේබලය

“ශක්ති කාර්යක්ෂමතා” ලේබලයෙහි නියමිත මිණුම්, ආකෘතිය හා අන්තර්ගත කරුණු අදාළ ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල විය යුතුය. විදුලි උපකරණයෙහි කාර්යක්ෂමතාවය නිර්ණය කිරීමේදී, උපකරණය මගින් හානිවන ශක්තිය හෝ ලබා ගන්නා ශක්තිය, පරිවර්තිත ශක්තිය උපයෝගී කර ගනිමින් අදාළ ප්‍රමිතියට අනුව තරු ලකුණු සංඛ්‍යාවක් ලබාදීම සිදු කෙරේ. මෙය තරු 01 සිට 05 දක්වා වේ. තරු ගණන වැඩි වූ විට කාර්යක්ෂමතාව වැඩි වන අතර උපරිම කාර්යක්ෂමතාවය සඳහා තරු 06ක් හිමි වේ.

## අයදුම් පත්

නිෂ්පාදකයා හෝ සැපයුම් කරු විසින් අදාල විදුලි උපකරණයේ සෑම මාදිළියක් / වර්ගයක්වෙන් වෙන් වශයෙන් අයදුම් පත් ලබා ගත යුතුය. එකම මාදිළිය/වර්ගය ස්ථාන කිහිපයක නිෂ්පාදනය කෙරේ නම් එම අදාළ ස්ථානයන්හි මාදිළිය/වර්ගය සඳහාද වෙන් වෙන් වශයෙන් අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ආනයන අවස්ථාවේදී අයදුම්කරු ශක්ති කාර්යක්ෂමතාවය නිර්ණය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන අයදුම්පතෙහි බලය ලත් නියෝජිතයා වේ. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ (ඉංජිනේරු) ප්‍රමිති ආයතනය වෙත යොමු කළ යුතුය.

## සහතිකකිරීමේ ගාස්තු

ශක්ති කාර්යක්ෂමතා අයදුම්පත් සඳහා රු: 500.00 මුදලක් ගෙවිය යුතු අතර, බලශක්ති කාර්යක්ෂමතා සහතිකයක් සඳහා රු: 5000.00 මුදලක් අය කෙරේ. එයට අමතරව නියැදි එකතු කිරීම, පරීක්ෂණ කටයුතු හා අධීක්ෂණ කටයුතු සඳහා වැයවන මුදල නිෂ්පාදකයා හෝ සැපයුම්කරු විසින් දැරිය යුතුය.

## නියැදීන් පරික්ෂා කිරීම

නිෂ්පාදකයාගේ හෝ සැපයුම්කරුගෙන් අහඹු ලෙස ලබා ගන්නා පරීක්ෂණ නියැදීන් ප්‍රමිති ආයතනයේ පරීක්ෂණාගාරය තුල හෝ පිළිගත් පරීක්ෂණාගාරයක් තුල අදාළ ප්‍රමිතියට අනුකූලව පරීක්ෂා කෙරේ.

**සහතිකකරණය**

අධ්‍යක්ෂ (ඉංජිනේරු) හෝ ඔහු නියෝජනය කරන්නෙකු පරීක්ෂණ වාර්තා අනුසාරයෙන් ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූලව විදුලි උපකරණයේ ශක්ති කාර්යක්ෂමතාවයට හිමි තරු ලකුණු ගණන නිර්ණය කරනු ලැබේ. ලබා ගත් තරු ලකුණු ගණනට හිමි සහතිකය ප්‍රදානය කිරීමට පෙර නිෂ්පාදකයා / සැපයුම්කරු ප්‍රමිති ආයතනය සමඟ එකඟවීමේ සහතික පතක් අත්සන් කළ යුතුය. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ අත්සන සහිතව නිකුත් කරනු ලබන බලශක්ති කාර්යක්ෂමතා සහතිකය ලබා ගැනීමෙන් පසුව අයදුම්කරුට තරු ලකුණු සහිත ශක්ති කාර්යක්ෂමතා ලේබලය එම භාණ්ඩයේ ඇලවීම හෝ ප්‍රදර්ශනය කිරීමේ අවසරය හිමි වේ.

මෙම බලශක්ති කාර්යක්ෂමතා සහතිකය අවුරුදු තුනක් සඳහා වලංගු වේ අයදුම්කරු විසින් නිෂ්පාදිත ස්ථාන කිහිපයක් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර ඇති විටකදී ඒ සඳහා ඔහු වෙන් වෙන් වශයෙන් සහතික පත් ලබා ගැනීම කළ යුතුය.

**අධීක්ෂණ පරීක්ෂා**

ප්‍රමිති ආයතන මගින් නිෂ්පාදකයා සැපයුම්කරු හෝ වෙළෙඳපොලින් ලබා ගන්නා පරීක්ෂණ නියැදීන් කාල ප්‍රාන්තරයන් තුලදී පරීක්ෂා කෙරේ. මෙහිදී බලශක්ති කාර්යක්ෂමතා සහතිකය ප්‍රදානය කිරීමේදී එම කාර්යක්ෂමතාවයට අදාළ තරු ගණන නිෂ්පාදකයා හෝ සැපයුම්කරු එලෙසින්ම පවත්වාගෙන යන්නේදැයි පරීක්ෂා කිරීම සිදු කෙරේ.

**ලේබල් මුද්‍රණය කිරීම**

නිෂ්පාදකයා හෝ සැපයුම්කරු විසින් ශක්ති කර්යක්ෂමතා ලේබලය මුද්‍රණය කළ යුතුය. කවර හෝ පාර්ශයක් මගින් නීත්‍යානුකූල නොවන අයුරින් ලේබලය මුද්‍රණය කිරීම වැළැක්වීම සඳහා මුද්‍රණය කර ඇති ලේබල් සංඛ්‍යාව, ඒවා අලවා ඇති විදුලි උපකරණවල භාණ්ඩ අංකය ආදී සම්පූර්ණ විස්තර ප්‍රමිති ආයතනය වෙත ඉදිරිපත් කළ යුතුය. නිෂ්පාදකයා හෝ සැපයුම්කරු වෙත නිකුත් කර ඇති බලශක්ති කාර්යක්ෂමතා සහතිකයට අනුව, අදාල විදුලි උපකරණයේ හෝ භාණ්ඩයේ වෙළෙඳනාමය/ වෙළෙඳ ලකුණ වර්ගය/මාදිලිය මොඩල් අංකය, තරු ගණන ආදිය ශක්ති කාර්යක්ෂමතා ලේබලයෙහි සඳහන් විය යුතුය.

**විමසීම:**
අධ්‍යක්ෂ (ඉංජිනේරු ප්‍රමිති)
දුරකථනය : 011 - 2671567 – 72
ඊමේල් : de@slsi.slt.lk

**SLS ලකුණ සහිත භාණ්ඩ සම්බන්ධයෙන් වන ඕනෑම පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුත්තේ :**

**අධ්‍යක්ෂ ජනරාල්**
ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
නො: 17 වික්ටෝරියා පෙදෙස
ඇල්විටිගල මාවත
කොළඹ 08
දුරකථනය - 94 1 2671574
ෆැක්ස් - 94 1 2671579
ඊමේල් - slsi@slsi.slt.lk